20 JANUARY 2026 | *Report Summary*

# ශ්‍රී ලංකාවේ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා තුළ සමාජ බලපෑම් කෙතරම් සාර්ථකව වාර්තා කරන්නේද?

## මූලික කරුණු

- පාරිසරික බලපෑම් ඇගයීමේ (EIA) වාර්තා සඳහා පරිශීලකයින් රාශියක් සිටින අතර එහි විවිධ භාවිතයන් ද වේ. ව්‍යාපෘති තුලින් ඇති කරන බලපෑම් පිළිබඳව ව්‍යාපෘති භූමිය අවට වෙසෙන ජනතාව විශේෂයෙන් සැලකිලිමත් වන අතර ආයෝජකයින් මෙම වාර්තා තුළින් ව්‍යාපෘතියේ තිරසාරභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට උනන්දුවක් දක්වයි. එබැවින්, මිනිසාගේ සංවර්ධන ව්‍යාපෘතිවලට මෙන්ම ස්වභාවික පරිසරයට හිතකර සමතුලිත තීරණ ගැනීමට හැකිවන ලෙස EIA වාර්තා නිවැරදි විය යුතු අතර, ඒවාට පහසුවෙන් ප්‍රවේශවීමට අවස්ථාව සැලසීම අත්‍යවශ්‍ය වේ.
- පාරිසරික බලපෑම් ඇගයීමේදී තක්සේරු කරනු ලද 'පරිසරය' යන්නට ජෛව හා භෞතික පරිසරය පමණක් නොව සමාජ-ආර්ථික පරිසරය ද ඇතුළත් වේ. නමුත් අතීතයේ සිදුකර ඇති පාරිසරික බලපෑම් ඇගයීම්වල දුර්වල ලෙස සමාජ බලපෑම් තක්සේරු කිරීම් හේතුවෙන් ජනතාවට පීඩා ගෙන දී ඇති අතර ව්‍යාපෘති අතරමග නවතා දමා ඇත. පවතින අධ්‍යයනයන්හි සමාජීය වශයෙන් සිදුවන බලපෑම් පිළිබඳ කරුණු දැක්වීමේදී ඒවායේ ගුණාත්මකභාවය කෙරෙහි එතරම් අවධානයක් යොමු වී නොමැත. අපගේ මෙම අධ්‍යයනය තුළින් එම සැලකිය යුතු විශ්ලේෂණාත්මක හිඩැස අවම කරයි.
- EIA වාර්තා වල සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුකරණයේ ගුණාත්මකභාවය අඩු බව මෙම අධ්‍යයන වාර්තාව තුළින් විදහා දැක්වෙයි. භාවිතා කරන ලද ක්‍රමවේද සහ දත්ත ලබාගත් මූලාශ්‍ර නිසි ලෙස සඳහන් කර නොමැති අතර වාර්තාවල යොදා ගෙන ඇති ආකෘතිය සහ භාවිතා කරන ඇති භාෂාව සාමාන්‍ය ජනතාවට පහසුවෙන් තේරුම්ගැනීමට අපහසුවේ. ඒවා නියාමන ආයතන විසින් නිකුත් කරන ලද කාර්ය නිර්දේශ (ToR) ලේඛනවල සඳහන් ගුණාත්මකභාවය පිළිබඳ සපුරාලිය යුතු අවශ්‍යතා සමඟ අනුකූල නොවේ.
- EIA වාර්තා ක්‍රියාවලියේ තත්ත්ව පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීමට, උපදේශකයින් පුහුණු කිරීම සහ ඔවුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට සහ මහජනතාවට EIA වාර්තා වෙත ඇති ප්‍රවේශය වැඩි කිරීමට දැඩි අවශ්‍යතාවයක් පවතී.

පාරිසරික බලපෑම් ඇගයීම (EIA) යනු ආරක්ෂණ පියවරයන් ශක්තිමත් කරන මෙන්ම සංවර්ධන කටයුතු හා ස්වභාවික පරිසරය සුරැකීම අතර සමතුලිතතාවය තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍ය ක්‍රමවේදයක් වේ. සැලකිය යුතු පාරිසරික බලපෑම් විය හැකි සියලුම ව්‍යාපෘති සඳහා EIA වාර්තාවක් ලබා ගැනීම අනිවාර්ය වේ. EIA වාර්තාවක් භෞතික හා ජෛව පරිසරය පමණක් නොව සමාජ පරිසරයද තක්සේරු කිරීමකට භාජනය කරයි. නමුත් ලංකාවේ EIA වාර්තා සහ ඒ වටා ඇතිවන විවේචන තුළින් බොහෝ දුරට සමාජ-ආර්ථිකය පිළිබඳ කරුණු කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු වී නොමැත.

'ඇගයීම් වාර්තා විශ්ලේෂණය ඇගයීම: ශ්‍රී ලංකාවේ EIA වාර්තා තුළින් පෙන්වා දී ඇති සමාජ බලපෑම් විශ්ලේෂණයක් යන මාතෘකාව යටතේ CSF නවතම පර්යේෂණ වාර්තාව මේ ආකාරයේ පළමු ක්‍රමානුකූල විශ්ලේෂණය වේ. එය වර්ෂ 1991 සිට 2025 දක්වා කාලය තුළ පළකරන ලද EIA වාර්තා තුළින් මතු කරන ලද සමාජීය බලපෑම් මත පදනම් වේ. EIA වාර්තා මාර්ගෝපදේශ සහ අදාළ කාර්ය නිර්දේශයෙහි දක්වා ඇති සපුරාලිය යුතු ගුණාත්මක අවශ්‍යතා සමඟ සමපාත වන්නේ දැයි විශ්ලේෂණය කිරීම සඳහා සෑම EIA වාර්තාවක්ම වෙන්වෙන්ව සමාලෝචනය කර ප්‍රධාන මානයන් සළකා බලා ලකුණු ලබා දී ඇත. EIA වාර්තා සැකසීමේදී ඒවායේ ගුණාත්මක භාවයට බලපාන සාධක ද විශ්ලේෂණය කරන ලදී.

ආර්ථික අර්බුදයෙන් මිදීම සහ වර්තමානයේ දිට්වා සුළි කුණාටුවෙන් පසු ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත්වීම සඳහා අනිවාර්යයෙන්ම නව ව්‍යාපෘති රාශියක් සහ නව ආයෝජන විශාල සංඛ්‍යාවක් සිදු කළ යුතු බැවින්, යෝජිත ව්‍යාපෘති තුළින් අවදානමට ලක්විය හැකි ප්‍රජාවට සිදුවන බලපෑම අවම කිරීමට සහ අනාගතයේ ඇතිවිය හැකි දේශගුණික විපර්යාස වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට EIA වාර්තාවල ශක්තිමත් සමාජ බලපෑම් විශ්ලේෂණක් අඩංගු කිරීම අත්‍යවශ්‍ය වේ.

CENTRE FOR A SMART FUTURE

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාවල සමාජ බලපෑම් වාර්තාකරණයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීමේ අවශ්‍යතාවය**

මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන කටයුතුවල මූලික අංගයක් බවට පත්වී ඇත. එම ව්‍යාපෘතිවල පරිමාණය අනුව ඒ හරහා අවට පරිසරය සැලකිය යුතු වෙනස්කම් වලට භාජනය වීමට ඉඩකඩ ඇත. එබැවින්, අහිතකර බලපෑම් ඇතිවීම වළක්වා ගැනීමට හෝ ඒවා අවම වන අයුරින් ව්‍යාපෘති සැලසුම් කිරීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් මූලික කරගත් සංවර්ධන කටයුතු තුළින් පෙන්නුම් කරන්නේ දුර්වල ලෙස සැලසුම් කරන ලද ව්‍යාපෘති ආර්ථිකයට බරක් වීම පමණක් නොව, ප්‍රාදේශීය ජනතාව අවතැන් කරන බවත්, ශ්‍රී ලංකාවේ දැනටමත් විනාශ වෙමින් පවතින ස්වභාවික පරිසරයට දැඩි හානි ගෙන දිය හැකි බවත්ය.

EIA වාර්තා යනු යෝජිත ව්‍යාපෘති මගින් ඇති විය හැකි හානි පුරෝකථනය කිරීමට සහ ඒවා අවම කිරීම සඳහා වන ක්‍රියාකාරී ක්‍රමවේදයකි. යෝජිත ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන විසින් ව්‍යාපෘතිය අනුමත කිරීමට ප්‍රථමයෙන්, EIA වාර්තාවේ කෙටුම්පත මහජනතාවගේ පරිශීලනය සඳහා විවෘතව තබනු ලැබේ. ණය ලබා දීම පිළිබඳ තීරණ ගැනීමේදී මූල්‍ය ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් විසින් EIA වාර්තා උපයෝගී කර ගනී. විවිධ මට්ටමේ තාක්ෂණික විශේෂඥතාව සහ ව්‍යාපෘති භූමියට හා ව්‍යාපෘතියට සම්බන්ධතාවයක් ඇති පාර්ශවකරුවන් රාශියක් EIA වාර්තා මත කටයුතු කරයි.එබැවින්, පාර්ශවකරුවන්ට එම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි බවට තහවුරු කිරීම සඳහා EIA වාර්තා නිවැරදි විය යුතු අතරම, ඒවාට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, EIA වාර්තා වල කරුණු වාර්තා කිරීමේ ගුණාත්මකභාවය නිරන්තරයෙන් විවේචනයට ලක්වේ. EIA ක්‍රියාවලියේදී දුර්වල ලෙස සිදු කරන ලද සමාජ බලපෑම් විශ්ලේෂණ දේශීය ප්‍රජාවන්ට අහිතකර ලෙස බලපා ඇති අවස්ථා බොහොමයක් අත්දැකීම් මත පදනම් වූ සාක්ෂි සහ සමාජ කතිකාවන් මගින් ඉස්මතු වී ඇත. මෙම අධ්‍යයනය විසින් සිදු කරන ලද සාහිත්‍ය සමාලෝචනයෙන් පැහැදිලි වන්නේ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාකරණයේ ගුණාත්මකභාවය පිළිබඳ ක්‍රමානුකූල විශ්ලේෂණ සිදු වී නොමැති බවයි.
තවද, පවතින අධ්‍යයනයන් ප්‍රධාන වශයෙන් ජෛව හා භෞතික අංශ කෙරෙහි අවධානය යොමු කරයි.
එබැවින්, පාරිසරික බලපෑම් ඇගයීමේදී සමාජ-ආර්ථික බලපෑම් පිළිබඳ කරුණු වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ඉතා අඩුවෙන් විශ්ලේෂණ වී ඇත.

**CSF වාර්තාව තුළින් අධ්‍යයනය කර ඇති කරුණු**

මෙම අධ්‍යයන වාර්තාව ශ්‍රී ලංකාවේ EIA වාර්තාවල ගුණාත්මකභාවය පිළිබඳ පවතින ලේඛන සහ මාර්ගෝපදේශ ගැන සමාලෝචනයක් සිදු කරයි. මෙහි අධ්‍යයන ක්‍රමවේදය දක්වා ඇති අතර අධ්‍යයනය මගින් සිදු කරන ලද විශ්ලේෂණ කාණ්ඩ තුනක් යටතේ සොයා ගන්නා ලද කරුණු ඇතුළත් වේ: (1) ඇගයීම් වාර්තා ප්‍රතිඵලවල විස්තර (2) සහසම්බන්ධතා සහ සංඛ්‍යාන විශ්ලේෂණ සහ (3) ගුණාත්මක නිරීක්ෂණ. අවසාන වශයෙන්, වාර්තාවල ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලද තීරණාත්මක ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි.

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාවල ගුණාත්මකභාවය පිළිබඳ සපුරාලිය යුතු නෛතික අවශ්‍යතා**

ශ්‍රී ලංකාවේ පරිසර බලපෑම් ඇගයීම් වාර්තා පාලනය කරන නීතිමය පද්ධතිය කොටස්වලට වෙන්වී ඇති අතර, එක්වර ක්‍රියාත්මක වන නීති හතරක් මෙහි සඳහන් වේ:

1. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (NEA)
2. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත
3. 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය
4. 1993 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත

ජාතික පාරිසරික පනත ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතනය මධ්‍යම පරිසර අධිකාරියයි. ජාතික පාරිසරික පනත සහ ඒ සමඟ ඇති රෙගුලාසි සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ, දේශීය නීති මගින් ස්ථාපිත කර ඇති සියලුම පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලීන් සඳහා අදාල වන ආකෘතිය සපයයි. තවද, අනෙකුත් නීති තුනට අදාල ප්‍රධාන ආයතන සාමාන්‍යයෙන් ඒවායේ අදාළ බල ප්‍රදේශය තුළ පාරිසරික බලපෑම් ඇගයීම් ආශ්‍රිත කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කරන ලද ක්‍රියා පටිපාටි සහ ආකෘති අනුගමනය කරයි.

පාරිසරික බලපෑම් ඇගයීමේ නීති සහ රෙගුලාසි මගින් EIA වාර්තා ගුණාත්මක විය යුතු බව අවධාරණය කර නොමැත. ඒ වෙනුවට, ගුණාත්මක අවශ්‍යතා ප්‍රධාන මූලාශ්‍ර දෙකක් මඟින් ඉදිරිපත් කර ඇත:
(1) මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා මාර්ගෝපදේශ ලේඛන සහ (2) එක් එක් පාරිසරික බලපෑම් ඇගයීම සඳහා නිකුත් කරන ලද කාර්ය නිර්දේශ.

**පර්යේෂණ අරමුණු සහ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය තුළින් 1991 සිට 2025 අතර කාලය තුළ සිදු කරන ලද EIA වාර්තා 250 ක් සමාජ බලපෑම් වාර්තා කරන ලද ආකාරය විශ්ලේෂණය කරයි. එය ශ්‍රී ලංකාව තුළ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා පහත අයුරින් දායක වේ:
1. පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා තුළ සමාජ බලපෑම් ඇගයීමේ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත මත පදනම් වූ වත්මත් තත්ත්වය පැහැදිලි කිරීම.
2. පාරිසරික බලපෑම් ඇගයීමේදී ගුණාත්මක භාවයේ මූලික ප්‍රවණතා තක්සේරු කිරීම සහ ප්‍රධාන පාර්ශවකරුවන් සඳහා ප්‍රමුඛතා නිර්දේශ යෝජනා කිරීම
3. වැඩිදුර විමර්ශන ක්‍රමවේද ඉස්මතු කිරීමෙන් ශ්‍රී ලංකාවේ EIA වාර්තා විධිමත් විශ්ලේෂණයේ විෂය පථය පුළුල් කිරීම.

ජාත්‍යන්තර ලේඛනවල දක්නට ලැබෙන සමාලෝචන නිර්ණායක මත පදනම්ව ගුණාත්මකභාවය පිළිබඳ අභිලාෂකාමී ප්‍රමිතීන් පැනවීම වෙනුවට, මෙම අධ්‍යයනය ජාතික පද්ධතිය විසින් අපේක්ෂා කරන සැබෑ ගුණාත්මක අවශ්‍යතා මත පදනම්ව EIA වාර්තා විශ්ලේෂණය කර ඇත.

EIA වාර්තාවල බොහෝ භාවිතයන් සහ පරිශීලකයින් මත සහ, EIA මාර්ගෝපදේශ සහ කාර්ය නිර්දේශ මගින් ඉස්මතු කර ඇති අවශ්‍යතාද සමඟ, මානයන් දෙකක් ඔස්සේ වාර්තාකරණයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කරන ලදි: 1) නියමිත අවශ්‍යතා සහ 2) තිබිය යුතු ගුණාංග.

නියමිත අවශ්‍යතා යනු සාමාන්‍ය පාරිසරික බලපෑම් ඇගයීමකින් අපේක්ෂා කරන සමාජ තක්සේරුකරණයේ මූලික සංරචක තුනකි, තිබිය යුතු ගුණාංග යනු විවිධ තාක්ෂණික විශේෂඥතාව සහ ව්‍යාපෘතියට සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ට EIA වාර්තා අර්ථවත් ලෙස භාවිතා කළ හැකි බව තහවුරු කිරීම සඳහා තීරණාත්මක වන වාර්තාකිරීමේ ගුණාත්මකභාවයේ ගුණාංග තුනකි.

මාර්ගෝපදේශ සහ කාර්ය නිර්දේශ පැහැදිලිවම අවශ්‍යතා මත පදනම් වූ මානයන් තුනම සපුරාලීම නියම කරන අතර, සමහර ගුණාංග මත පදනම් වූ මානයන් පමණක් අනිවාර්යය කර දක්වා ඇත. අනෙකුත් ගුණාංග මාර්ගෝපදේශ සහ කාර්ය නිර්දේශයෙහි ව්‍යංගයෙන් සඳහන් කර ඇත.

**විශ්ලේෂණය කරන ලද මානයන් සහ අංශ**

**1. නියමිත අවශ්‍යතා**

*පවතින පරිසරය පිළිබඳ විස්තරය::*
- භාවිතා කරන ක්‍රමවේද වාර්තා කර තිබේද?
- බාහිර විශ්ලේෂණාත්මක අධ්‍යයන භාවිතා කර තිබේද?

*බලපෑම් හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ තක්සේරුව:*
- භාවිතා කරන ක්‍රමවේද වාර්තා කර තිබේද?
- විශේෂ බලපෑම් වර්ගීකරණය කර තිබේද?
- එසේ නම්, වර්ගීකරණයට අදාල නිර්වචන ඉදිරිපත් කර තිබේද?

*හානි අවම කිරීම සඳහා යෝජිත ක්‍රම:*
- හානි අවම කිරීමේ යෝජිත ක්‍රමවල ඵලදායීතාවය සඳහන් කර තිබේද?
- හානි අවම කිරීමේ ක්‍රම යෝජනා සඳහා තර්කානුකූල පදනම දක්වා තිබේද?

**2. තිබිය යුතු ලක්ෂණ**

*ප්‍රවේශ්‍යතාව::*
- EIA වාර්තා සහ විධායක සාරාංශ කොපමණ දිගු වේද?
- විධායක සාරාංශවල භාවිතා කරන භාෂාව තාක්ෂණික භාෂාවක්වේ ද?

*තහවුරු කිරීමේ හැකියාව:*
- භාවිතා කරන ලද ක්‍රමවේද වාර්තා කර තිබේද?
- සමීක්ෂණයක් පවත්වන්නේ නම්, වැදගත් නියැදි පිළිබඳ තොරතුරු සපයා තිබේද?

*සුපිළිපන්නභාවය:*
- සීමාවන් සහ උපකල්පන අනාවරණය කර තිබේද?
- විධායක සාරාංශවල භාවිතා කරන භාෂාව විෂය මූලික වේද?

**සැලකිය යුතු කරුණු**

- මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා (IEEs) හැර, EIA වාර්තාවල (සහ අතිරේක EIAs) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති අනුවාද පමණක් විශ්ලේෂණයට ලක් කරන ලදී.
- • සංවර්ධන හවුල්කරුවන්ගේ EIA මාර්ගෝපදේශවල සඳහන් ප්‍රමිති අවශ්‍යතා මෙහිදී සැලකිල්ලට ගෙන නොමැත.

**ප්‍රධාන විශ්ලේෂණාත්මක ප්‍රතිඵල**

***1. නිරීක්ෂණ තහවුරු කරගැනීම සඳහා බාහිර විශ්ලේෂණ තොරතුරු භාවිතා කර ඇත්තේ ඉතාම අඩු වාර්තා ප්‍රමාණයක වේ***

වාර්තා වලින් 71% ක් පමණක් විස්තරාත්මක සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම සඳහා බාහිර තොරතුරු මූලාශ්‍ර භාවිතා කරයි. යෝජිත ව්‍යාපෘති භූමිය අවට පරිසරයේ ජනගහන සහ සමාජ-ආර්ථික සාධක පිළිබඳ දත්ත අඩංගු වන වගු ගණනාවක් දක්නට ලැබෙන නමුත්, ඒවා ග්‍රාම නිලධාරීන් සතු හෝ ප්‍රාදේශීය පරිපාලනයට සම්බන්ධ දත්තවලින් හෝ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මූලාශ්‍ර වලින් උපුටා ගන්නා ලද ඒවා වේ. පවතින සමාජ-ආර්ථික පිළිබඳ විශ්ලේෂණ උපුටා දක්වන්නේ 10% ක් පමණි. මෙයින් ඇඟවෙන්නේ බොහෝ වාර්තා EIA වාර්තා පිළියෙළ කරන්නන්ගේ දත්ත සහ අර්ථ නිරූපණයන් මත සම්පූර්ණයෙන්ම රඳා පවතින බවයි.

***2. සමාජ බලපෑම් විශ්ලේෂණය කිරීමේ සහ වාර්තා කිරීමේදී සැලකිය යුතු අඩුපාඩු දක්නට ලැබේ***

කාර්ය නිර්දේශ වලින් 91% ක් සමාජ බලපෑම් තක්සේරු කිරීම සහ වාර්තා කිරීම අවශ්‍ය කර තිබුනද, වාර්තාකරණ අවශ්‍යතා සම්බන්ධයෙන් කාර්ය නිර්දේශ අතර සැලකිය යුතු වෙනස්කම් ඇත. 17% තුළ (කාර්ය නිර්දේශ 40ක්) නියමිත ක්‍රමවේදය සඳහන් කිරීම හෝ බලපෑම් වර්ගීකරණය අවශ්‍ය ලෙස සඳහන් නොවේ. ව්‍යාපෘතිය මඟින් සිදුවන බලපෑම් හඳුනා ගැනීමට සහ ඇගයීමට භාවිතා කරන ක්‍රමවේදය පිළිබඳ පැහැදිලි කිරීමක් EIA වාර්තා 45% ක අඩංගු නොවේ. සමාජ-ආර්ථික බලපෑම් බොහෝ විට සෘජු නොවන, ප්‍රමාණාත්මත අගයක් කිව නොහැකි සහ අනුමාන කරන ලද ඒවා වන බැවින් ඒවා විශේෂයෙන් අවධානයට ලක් කළ යුතුය. අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳ පැහැදිලි බවක් නොමැතිකම හේතුවෙන්, වාර්තාවේ කරන ලද ඇගයීම් නිසි ලෙස පරිශීලනය කිරීමට පාඨකයින්ට ඇති හැකියාවට බලපෑම් ඇති කරයි.

සමාජ බලපෑම් පිළිබඳ වාර්තා කර ඇති බොහෝ EIA වාර්තා වල (52%) එම කරුණු විස්තරාත්මකව පමණක් පැහැදිලි කර ඇති අතර, ඒවා කෙටි කාලීන හෝ දිගු කාලීන, සෘජු හෝ වක්‍ර, සහ ආපසු හැරවිය හැකි හෝ ආපසු හැරවිය නොහැකි බලපෑම් වශයෙන් වර්ගීකරණක් ඇතුළත් කර නොමැත.

බලපෑම් වර්ගීකරණය කර ඇති වාර්තාවලින් 24% ක පමණක් එම වර්ගීකරණයන් සඳහා භාවිතා කර ඇති පරිමාණය නිර්වචනය කර තිබීම සැලකිය යුතු කරුණකි . උදාහරණයක් ලෙස, බලපෑම්වල ප්‍රමාණය සහ කාල සීමාව 1 සිට 5 දක්වා පරිමාණයකින් සලකුණු කර ඇත්නම්, වාර්තාවලින් 76% ක්ම බලපෑම්වල ප්‍රමාණය හෝ කාල සීමාව සඳහා 1, 2, 3, 4 සහ 5 යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිර්වචනය කර නොමැත. එම නිසා, EIA වාර්තා පිළියෙල කරන්නන් විසින් බලපෑම් ඇගයීමට යොද ගෙන ඇති තර්කය පරිශීලකයන්ට තේරුම්ගැනීමට අපහසු වේ.

***3. යෝජිත හානි අවම කිරීමේ ක්‍රමවල ඵලදායීතාවය සහ තාර්කානුකූල පදනම විශ්වාසනීයව වාර්තා කර ඇත්තේ ඉතා සුළු EIA වාර්තා ප්‍රමාණයක පමණි.***

බොහෝ කාර්ය නිර්දේශ (60%) මඟින් EIA වාර්තා තුළ හානි අවම කිරීමේ ක්‍රමවල කාර්යක්ෂමතාව සහ තාර්කානුකූල පදනම යන දෙකම ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව දක්වා ඇත. කෙසේ වෙතත්, එම වාර්තාවලින් 79% ක යෝජිත හානි අවම කිරීමේ ක්‍රමවල ඵලදායීතාවය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නොමැති අතර, EIA වාර්තාවලින් 40% ක පමණක් දත්ත සහ සාක්ෂි සහිතව තාර්කානුකූල පදනම ඉදිරිපත් කර ඇත.

***4. EIA වාර්තා මාර්ගෝපදේශවලට වඩා දීර්ඝ වන අතර සාමාන්‍ය පාඨකයින්ට කියවා සහ තේරුම් ගැනීමට අපහසු බව වැඩි වෙමින් පවතී***

EIA වාර්තා වල දිග ප්‍රමාණය වැඩි වෙමින් පවතී. සමහර වාර්තා ඇමුණුම් නොමැතිව ද පිටු 500 ටත් වඩා දිගු වන අතර, එය මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශවල නිර්දේශිත පිටු 100 සීමාව ඉක්මවා යයි. විධායක සාරාංශ ද මේ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි. සමහර සාරාංශ පිටු 20 කට වඩා ළඟා වන අතර එය මාර්ගෝපදේශයේ නිර්දේශිත පිටු 5 සීමාව මෙන් හතර ගුණයකි. ඇමුණුම් බොහෝ විට ප්‍රධාන වාර්තාවට වඩා දිගු බැවින්, මේ තුළින් ඇඟවෙන්නේ EIA වාර්තා මහජනතාවට පහසුවෙන් පරිශීලනය කළ නොහැකි වෙමින් පවතිනවා පමණක් නොව, මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශ යල් පැන ඇති බවයි.

විධායක සාරාංශවල භාවිතා වන භාෂාව කියවීමට තාක්ෂණිකව අපහසු වන අතර, කියවීමේ පහසුව මනින Average Flesch Reading Ease Scale 28.0347 ක් වන අතර එය ඉන්දියාව වැනි කලාපීය රටවල වාර්තාවලට වඩා ඉහළ අගයක් ගනී.

### *5. ගුණාත්මක අවශ්‍යතා සඳහන් කර ඇති කාර්ය නිර්දේශ වඩා හොඳ වාර්තා නිර්මාණය කරන නමුත් කාර්ය නිර්දේශ අනුකූල ලෙස සකස් කර නොමැත*

පරිපූර්ණ මට්ටමට ආසන්න නොවූවත්, නිශ්චිත වාර්තාකරණ මිනුම් පැහැදිලිව අවශ්‍ය කරන කාර්ය නිර්දේශ ඇති අවස්ථාවලදී, එවැනි නියමිත අවශ්‍යතා සඳහන් කර නොමැති කාර්ය නිර්දේශ වලට සාපේක්ෂව වඩා ගුණාත්මක වාර්තා සකස් කර ඇත. එබැවින් බොහෝ EIA වාර්තා කාර්ය නිර්දේශයෙහි සඳහන් නියමිත අවශ්‍යතා අනුගමනය නොකළද, EIA වාර්තාවල ගුණාත්මක භාවයට කාර්ය නිර්දේශ බලපෑම් ඇති කරයි. මෙය කාර්ය නිර්දේශ කෙටුම්පත් කිරීමේ ක්‍රියා පටිපාටිය ප්‍රමිතිකරණය කිරීම පමණක් නොව, ව්‍යාපෘති අනුමත කරන ආයතන (PAAs) තුළ පිහිටුවා ඇති EIA විශේෂ ඒකක ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ ධාරිතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය දැඩි ලෙස දක්වා ඇත. එකම ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් කෙටුම්පත් කරන ලද කාර්ය නිර්දේශ තුළ තක්සේරු කරන ලද ගුණාත්මක මිනුම් බෙහෙවින් අසමාන වේ. ව්‍යාපෘති විශේෂිත අවශ්‍යතා පැවතීම මෙම විචලනයට හේතුවක් ලෙස පැහැදිලි කළ නොහැක. මන්ද මෙම අධ්‍යයනය මගින් විශ්ලේෂණය කරන ලද කාර්ය නිර්දේශයෙහි අංශ වාර්තාකරණ ගුණාත්මක භාවයට සම්බන්ධ වන අතර එය ව්‍යාපෘති ලක්ෂණ මත පදනම්ව වෙනස් නොවිය යුතුය.

### *6. ආයතනික ලක්ෂණ EIA වාර්තාවල ගුණාත්මක භාවයට බලපායි*

ව්‍යාපෘති යෝජකයා රාජ්‍ය අංශයට අයත් වන ව්‍යාපෘතිවලදී EIA වාර්තා ගුණාත්මකභාවය සාමාන්‍යයෙන් වඩා හොඳ මට්ටමක පවතින බව ප්‍රතිඵල තුළින් පෙන්නුම් කරයි. ජාත්‍යන්තර සංවර්ධන සමාගමක සහභාගීත්වය ද වඩා හොඳ ගුණාත්මකභාවයක් ගෙන ඒමට හේතුවේ. මුදල් සපයන යාන්ත්‍රණ වර්ගය විසින් ඇති කරන බලපෑම මිශ්‍ර ස්වභාවයකින් ගනී. සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය විසින් මුදල් සපයන ලද ව්‍යාපෘති බොහෝ මාන හරහා අඩු ගුණාත්මක භාවයක් ඇති කිරීමට නැඹුරු වුවද, පොදු මූලාශ්‍ර හා මිශ්‍ර මුදල් සැපයුම් හරහා සම්පූර්ණයෙන් මුදල් සපයන ලද ව්‍යාපෘති වඩා හොඳින් ක්‍රියාවේ යෙදේ.

### *7. උපදේශන කණ්ඩායම්වල ස්වභාවය සහ සංයුතිය EIA වාර්තාවල ගුණාත්මකභාවයට බලපායි*

ආයතනික උපදේශකයින් (රාජ්‍ය දෙපාර්තමේන්තු, උපදේශන සමාගම්, විශ්ව විද්‍යාල ආදියෙහි පර්යේෂණ සහ සංවර්ධන ඒකක) නිරන්තරයෙන්ම ආයතනික අනුබද්ධතාවයක් දක්වා නොමැති EIA වාර්තා සකස්කිරීමේ කණ්ඩායම්වලට වඩා හොඳින් කටයුතු කරයි. ආයතනික උපදේශනයට පරිමාණය (උදා: විශේෂයෙන් වෙන්වූ ආකෘති සහ පර්යේෂණ ඒකක) සහ ආයතනික දත්ත (සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි) වැනි වාසි ඇති බව අවබෝධකර ගත හැකිය. අවසාන වශයෙන්, අපේක්ෂා කළ පරිදි, සමාජ-ආර්ථික විශේෂඥයෙකු ඇතුළත් කර ගැනීම තෝරාගත් සියලුම මානයන් හරහා ගුණාත්මකභාවය වැඩි කිරීමට හේතු වන බව කිව හැකිය.

### *8. සමාජ බලපෑම් විශ්ලේෂණ සිදු කිරීමේදී සමහර වාර්තා ආචාර ධර්ම අනුගමනය නොකරයි*

සමහර EIA වාර්තාවල කරන ලද අර්ථකථන සහ නිගමන දුගී සහ ග්‍රාමීය ප්‍රජාවන්ට විරුද්ධවාදී භාෂාවක් භාවිතා කරන බව දැකිය හැකිය. එක් වාර්තාවක සඳහන් වන්නේ "සෑම මායිම් ප්‍රජාවකම දක්නට ලැබෙන හිමිකම් පෑමට ඇති ආශාව, ආක්‍රමණශීලී බව සහ නීතිය කෙරෙහි ඇති අප්‍රසාදය යම් ප්‍රමාණයකට මෙහි දැකිය හැකියි. මෙම පිටස්තර පුද්ගලයින්ගේ පැමිණීම නිසා ප්‍රදේශයේ ඇති සාම්ප්‍රදායික ගම්මාන කිහිපයක් යටපත් වී ඇත. එවැනි තත්වයක් තුළ, පැමිණෙන ව්‍යාපෘති සේවකයින්ගෙන් ඇතිවන බලපෑම නොවැදගත් වනු ඇත"යන්නයි. මෙවන් අවස්ථාවකදී, ව්‍යාපෘති තුළින් ඇතිවිය හැකි බලපෑම වැදගත් නොවන බව සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රජාවක් පිළිබඳ පුළුල් සාමාන්‍යකරණයක් භාවිතා කරයි. තවත් සමහරක් ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් ඇතිවිය හැකි බලපෑම් ලෙස දේශපාලනික බලපෑම් ඇතුළත් කර ඇත. "ව්‍යාපෘති භූමියේ ශ්‍රමිකයින් වැඩි වීම වෘත්තීය සමිති නිර්මාණය වීමට සහ රටේ ප්‍රධාන පෙළේ දේශපාලනය සමඟ ඔවුන් සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා උත්තේජනයක් විය හැකිය. එවැනි වෘත්තීය සමිති සහ දේශපාලන ව්‍යාපාරවල අන්තවාදී දේශපාලන ක්‍රියාකාරකම් ප්‍රදේශයේ ආයෝජන ව්‍යාපෘතිවල නිසි ක්‍රියාකාරීත්වයට බරපතල තර්ජනයක් විය හැකිය" යන්න තවත් වාර්තාවක දක්වා ඇත.

### *9. බොහෝ EIA වාර්තාවල සාධාරණ කරුණු පැහැදිලි කිරීමකින් තොරව සමහර සමාජ ප්‍රතිලාභ දක්වා ඇත*

සමාජ-ආර්ථික බලපෑම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී, EIA වාර්තා බොහෝ විට අවම සාධාරණ කරුණු පැහැදිලි කිරීමක් හෝ එසේ පැහැදිලි කිරීමකින් තොරව ප්‍රතිලාභ පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරයි. නිතර දක්නට ලැබෙන එවැනි ප්‍රතිලාභ දෙකක් ලෙස ව්‍යාපෘතිය තුළින් ඇති වන රැකියා ප්‍රතිලාභ සහ ව්‍යාපෘති නිසා සිදුවන දේපල වටිනාකම්වල ඉහළ යාම දක්වා ඇත. තවද, සමහර EIA වාර්තාවල ව්‍යාපෘති යෝජකයා හෝ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන පාර්ශවයන් විසින් යෝජිත ආයතනික සමාජ වගකීම් (CSR) මුලාරම්භ සමාජ-ආර්ථික ප්‍රතිලාභ ලෙස දැක්වේ. ව්‍යාපෘති යෝජකයාගේ හෝ සංවර්ධනය කටයුතු සිදු කරන පුද්ගලයාගේ අභිමතය පරිදි ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක වන ආයතනික සමාජ වගකීම් යෝජිත ව්‍යාපෘතිය නිසා ඇති වන එවැනි වාසිදායක බලපෑම්ද යන්න පැහැදිලි නැත.

### *10. සමහර EIA වාර්තා, වෙනත් EIA වල තිබෙන බලපෑම් විස්තර සෘජුවම නැවත භාවිතා කරයි.*

එකම හෝ වෙනස් උපදේශකයින් විවිධ EIA වාර්තා හරහා කිසිදු වෙනස්කමකින් තොරව භාවිත කළ හැකි සමාජ තත්ත්ව ප්‍රකාශනවල සම්මත ආකෘති භාවිතා කළ අවස්ථා කිහිපයක් දැකගත හැකිය. වසර 9 ක කාලයක් තුළ ප්‍රකාශයට පත් කරන ලද EIA වාර්තා 5 ක එවැනි ප්‍රකාශයක් (බොහෝදුරට සමාන) පළ විය. අදාළ සනාථ නොකළ බලපෑම් විස්තර සෘජුවම පිටපත් කිරීමෙන් වාර්තා අවශ්‍ය තොරතුරු නොමැති දීර්ඝ වාර්තා වන අතර ව්‍යාපෘතිය සඳහා වැදගත්වන කිසිදු නිශ්චිත තොරතුරක් එක් නොකරයි.

### *11. සමාජ-ආර්ථික සමීක්ෂණවල ඇමුණුම් සහ වගු තුළින් පුද්ගලික සහ සංවේදී තොරතුරු නිරාවරණය කරයි*

අවසාන වශයෙන්, බොහෝමයක් EIA වාර්තාවල ප්‍රධාන වාර්තාවේ හෝ ඇමුණුම්වල ඉහත කී තොරතුරු ඇතුළත් වේ. බොහෝ අවස්ථාවන්හිදී සමීක්ෂණ සඳහා සම්බන්ධ වූවන්ගේ සහ සම්මුඛ පරීක්ෂණ සඳහා ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින්ගේ පුද්ගලික තොරතුරු අඩංගු වේ. ඒවා අතර පදිංචි ලිපින, ආදායම්, ඉඩම්වල වටිනාකම සහ නිශ්වල වත්කම්, ජාතික හැඳුනුම්පත් අංක සහ දුරකථන අංක වැනි තොරතුරු වේ. ඒ තුළින් අවධානමට ලක්වන පුද්ගලයින්ගේ සංඛ්‍යාවද ද සුළු නොවන අතර, බොහෝ විට පුද්ගලයින් 100 ඉක්මවයි.

ප්‍රතිසංස්කරණ යෝජනා

### 1. EIA වාර්තාවල තත්ත්ව පාලන යාන්ත්‍රණය ශක්තිමත් කළ යුතුය

ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර ස්ථාවර සමාජ-ආර්ථික විශේෂඥතාව සඳහා වැඩි ප්‍රවේශයක් තිබිය යුතුය. EIA මාර්ගෝපදේශවල අදාළත්වය පැහැදිලි කළ යුතු අතර මාර්ගෝපදේශ නවීකරණය කොට දැනුවත් කිරීම සිදු කළ යුතුය. EIA වාර්තාවල අඩංගුවන පුද්ගලික සහ සංවේදී තොරතුරු භාවිතය සහ කළමනාකරණය නියාමනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. තවද කාර්ය නිර්දේශ කෙටුම්පත් කිරීම ප්‍රමිතිගත කළ යුතුය.


### 2. උපදේශකයින් අතර සමාජ-ආර්ථික විශ්ලේෂණය සඳහා හැකියාවන් වැඩි දියුණු කළ යුතුය

EIA වාර්තා වලට අදාළ වන සමාජ-ආර්ථික සලකා බැලීම්වල සීමාවන්, ප්‍රාථමික සහ ද්විතීයික දත්ත භාවිතා කරමින් ප්‍රායෝගික පර්යේෂණ පැවැත්වීම සහ වාර්තා කිරීම සඳහා ශිල්පීය ක්‍රම, සුදුසු උපුටා දැක්වීමේ ක්‍රම ඇතුළත් කිරීම, සහ ප්‍රාථමික දත්ත එකතු කිරීම සහ අර්ථ නිරූපණය කිරීම පිළිබඳ ආචාර ධර්ම අඩංගු මොඩියුල, පුහුණු වැඩසටහනට ඇතුළත් කළ යුතුය.

### 3. මහජනතාවට සහ ප්‍රධාන පාර්ශවකරුවන්ට EIA වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩි දියුණු කළ යුතුය

විධායක සාරාංශවල ව්‍යුහය සහ භාවිතා කරන භාෂාවද ඇතුළුව ඒවා ප්‍රමිතිකරණය කළ යුතුය අතර, එමගින් වැදගත් තොරතුරු, පුරෝකථනය කළ හැකිවීම සහ ප්‍රවේශ විය හැකි ආකාරයකින් දැක්වීමට පුළුවන. සමීක්ෂණ නියැදි ලබා ගැනීමේ ක්‍රමවේද සහ උපදේශන වලදී අදාළ පාර්ශ්වකරුවන්ගේ ආවරණය වැනි සමාජ-ආර්ථික විශ්ලේෂණයේ තීරණාත්මක වන අංශ පරීක්ෂා කිරීමට උපකාරී වන පරිදි මහජනතාව සඳහා වන මෙවලම් යාවත්කාලීන කළ යුතුය.

**1 රූපය: විශ්ලේෂණ වර්ග අනුව ප්‍රතිඵලවල සම්පූර්ණ සාරාංශය**



**වගුව 1: නිර්දේශ අනුක්‍රමිකය**

| නිර්දේශ | අදාළ ප්‍රධාන කොටස්කරුවන් |
|---|---|
| 1. EIA ක්‍රියාවලිය පාලනය, කළමනාකරණය සහ ඇගයීම | |
| 1.1. EIA වාර්තාකරණය පිළිබඳ ක්‍රමානුකූල අධීක්ෂණ සහ ඇගයීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන |
| 1.2. ස්ථාවර සමාජ-ආර්ථික විශේෂඥතාව සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන මට්ටමේ ප්‍රවේශය වැඩි කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන සහ අදාල විෂය භාර අමාත්‍යාංශ |
| 1.3. මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශවල අදාළත්වය තක්සේරු කිරීම සහ සංශෝධනය කිරීම | මධ්‍යම පරිසර අධිකාරිය |
| 1.4. කාර්ය නිර්දේශ ආකෘති සහ වාර්තා කෙටුම්පත් කිරීමේ ක්‍රියා පටිපාටි ප්‍රමිතිකරණය හා විධිමත් කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය  සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන |
| 1.5. EIA වාර්තාවල පුද්ගලික තොරතුරු භාවිතය සහ කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම | මධ්‍යම පරිසර අධිකාරිය |
| 1.6. ලේඛන ආකෘති පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වා දීම | මධ්‍යම පරිසර අධිකාරිය සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන |
| 2. පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) සිදු කිරීම පිළිබඳ කර්මාන්ත පරිචය, පුහුණුව සහ දැනුම බෙදා දීම | |
| 2.1. EIA පුහුණුව සහ සුදුසුකම් සනාථ කරන ලේඛනවල සමාජ-ආර්ථික විශ්ලේෂණ පිළිබඳ මොඩියුල හඳුන්වා දීම. | මධ්‍යම පරිසර අධිකාරිය, විශ්වවිද්‍යාල, කර්මාන්ත සංගම්, පෞද්ගලික අංශය සහ සංවර්ධන හවුල්කරුවන් |
| 2.2 ආයතනික සහයෝගීතාවයන් තුළින් ශ්‍රී ලාංකික සමාජ-ආර්ථික සංස්කෘතික දත්ත ලබාගැනීමේ පහසුකම් ප්‍රවේශය වැඩි කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය (ජාතික පරිසර තොරතුරු මධ්‍යස්ථානය), විශ්වවිද්‍යාල සහ අදාළ විෂය භාර අමාත්‍යාංශ |
| 3. මහජන සහභාගීත්වය සහ අධීක්ෂණය | |
| 3.1. EIA වාර්තාවල සමාජ බලපෑම් වේගවත්ව තක්සේරු කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරන ලද මෙවලම් හඳුන්වා දීම. | විශ්ලේෂණ මධ්‍යස්ථානය, සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් |
| 3.2. EIA වාර්තා පරිශීලනය කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳව මාධ්‍ය සහ මාධ්‍යවේදීන් පුහුණු කිරීම. | විශ්ලේෂණ මධ්‍යස්ථානය, සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් |
| 4. දේශීය සහ විදේශීය ණයහිමියන්ගේ සළකා බලන කරුණු | |
| 4.1. EIAs දේශීය භාවිතය මත සංවර්ධන හවුල්කරුවන්ගේ අවශ්‍යතා සහ ක්‍රියාවලීන් දැනුම් දීම. | සංවර්ධන හවුල්කරුවන් |
| 4.2. වාර්තා කිරීමේ ගුණාත්මකභාවය සහ සැළකිය යුතු බලපෑම් හිමිකම් තක්සේරු කිරීම සඳහා මෙවලම් හඳුන්වා දීම. | මුදල් අමාත්‍යාංශය සහ දේශීය මූල්‍ය ආයතන |

## Participant Notes

To explore more, read the full report
available on the CSF Website

## Centre for a Smart Future (CSF) is a Colombo-based think tank with researchers, advisors, and partners around the world.

We conduct high-quality research, promote collaboration across disciplines, and generate actionable ideas. Our current work is anchored to influencing a just recovery from Sri Lanka's polycrisis, with the environment and human well-being at the core. Our research has partnered with organisations such as Institute of Development Studies, London School of Economics, International Labour Organization, Open Society Foundations, Blue Resources Trust, Parliament of Sri Lanka, and Biodiversity Sri Lanka. What sets us apart is our interdisciplinary approach to research and policy advocacy. We like being imaginative in how we think about challenges and solutions.

We continually engage with a spectrum of stakeholders - from local communities to policymakers - which ensures that our research is relevant and accessible to a broad audience, while also contributing to meaningful policy change.

## A publication under CSF's thematic pillar on: Nature, Climate and the Economy

We conduct research, convene stakeholders, and communicate policy imperatives for putting nature and natural capital at the core of Sri Lanka's post-crisis economic recovery, and its medium-term development pathways.

Ongoing work includes innovative financing for conservation and a green recovery, strengthening financial institutions' environmental integration, nature-positive tourism, and reorienting growth towards better considerations of natural capital.

@CSFasia
@centreforasmartfuture
@csfasia
@centreforasmartfuture

www.csf-asia.org